සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** **9ශ්‍රේණිය**
**முதலாம் தவணைப் பரீட்சை 2018** **தரம் 9**
**First Term Test 2018** **Grade 9**

**කතෝලික ධර්මය -I කොටස**
**Catholic**

**පැය දෙකයි**
***Two hours***

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

1. පැරණි ගිවිසුම තුළ එළිදරව් සාහිත්‍යයට අයත් ග්‍රන්ථය වන්නේ,

   I). හිතෝපදේශය II). දානියෙල් III). ගණන් කථාව IV). සිරාක්

2. පංච පුස්තකයට අයත් ග්‍රන්ථයක් වන්නේ,

   I). නික්මයාම II). වීරාවලිය

   III). ගීතාවලිය IV). හිතෝපදේශය

3. ශුද්ධ බයිබලයේ යාච්ඤා පොත ලෙස හඳුන්වන්නේ,

   I). හිතෝපදේශය II). ලෙවි ව්‍යවස්ථාව

   III). යෙසායා IV). ගීතාවලිය

4. ජේසුස් වහන්සේගෙන් පසුව මුල් කිතුනු සභාවේ වර්ධනය පිළිබඳ සඳහන් ග්‍රන්ථය වන්නේ,

   I). ලූක් සුවිශේෂය II). ක්‍රියා පොත

   III). එළිදරව්ව IV). මතෙව් සුභාරංචිය

5. නව ගිවිසුමට අයත් සංදේශ ගණන වන්නේ,

   I). 12 කි II). 18 කි III). 20 කි IV). 21 කි

6. දුක්ප්‍රාප්තියේ සුවිශේෂය ලෙස හඳුන්වනු ලබන්නේ,

   I). ශු. මාක් තුමාය II). ශු. මතෙව් තුමාය III). ශු.ලූක් තුමාය IV). ශු. ජුවාම් තුමාය

7. ශු. ජොහාන් සුවිශේෂය ලියවුණු කාල වකවානුව වන්නේ,

   I).ක්‍රි.ව 80-90 II). ක්‍රි.ව 90-100 III). ක්‍රි.ව 64-70 IV). ක්‍රි.ව 70-80

8. "මම වෙමි" ප්‍රකාශන මගින් ජේසුන් වහන්සේ උගන්වන පොදු පණිවිඩය වන්නේ,

   I). යුගාන්තය පිළිබඳවයි II). පාපය පිළිබඳවයි III). සදාතන ජීවිතය පිළිබඳවයි IV). සත්ප්‍රසාදය පිළිබඳවයි

9. දුර්පරීක්ෂාවක් පැමිණෙන විට අප කළ යුතු වන්නේ,

   I). යහළුවා සමග බෙදාගත යුතුය II).හෘද සාක්ෂියට සවන් දී එයට අවනත විය යුතුය

   III). දෙමාපියන්ට පැවසිය යතුය IV). එයට විරුද්ධව සටන් කළ යුතුය

10. සමිඳානන් වහන්සේ කායින් පිට තැබූ සලකුණ,

I). දණ්ඩණයේ සලකුණකි.

II). වරණයේ ලාංඡනය කි.

III). ජයග්‍රහණයේ සලකුණකි.

IV). දේව රැකවරණයේ ලාංඡනය කි.

II කොටස

01. 1 ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ දෙකක් නම් කරන්න

2.ප්‍රධාන දිවැසි ග්‍රන්ථ දෙකක් ලියන්න

3.අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි සඳහන් වන විශේෂ කරුණු දෙකක් ලියන්න

4.ගීතාවලියේ ගීත ලියා ඇති තේමා දෙකක් ලියන්න

5.සවදර්ශක සුවිශේෂ පොත් නම් කරන්න

6.ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය.ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි.මෙහි අවස්ථා සම්බන්ධය ලියන්න

7.මතෙව් සුභාරංචිය සඳහා භාවිතා වන නම් දෙකක් ලියන්න.

8. ජොහාන් 15 : 1 සඳහන් මම වෙමි ප්‍රකාශය ලියන්න

9.උත්පත්ති පොතට අනුව සර්පයාට ලැබුණු පාපයේ ප්‍රතිඵල දෙකක් ලියන්න

10.ඔබේ සහෝදරයා වූ ආබෙල් කොහේද? සමිඳුන් ඇසූ ප්‍රශ්නයට කායින් දුන් පිළිතුර ලියන්න

**සියළුම ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න**

02. I. ගීතාවලිය හඳුන්වන වෙනත් නමක් ලියන්න

II. ගීතාවලියෙහි ගීත වර්ගීකරණයට අනුව ගීතිකා වර්ග 03 ක් ලියන්න

III. තුති පිදීමේ ගීතිකා යන්න හඳුන්වා තුති පිදීමේ ගීතිකාවක් ලියන්න

03. I. ශු. ජොහාන් සුවිශේෂයේ අරමුණු ලියන්න.

II. "මම වෙමි ප්‍රකාශන" 03 ක් ලියන්න

III. ප්‍රසාද ස්නාපනය ලැබූ ඔබ ලොකයේ ආලෝකය යන ප්‍රකාශනයට අනුව දිවි ගෙවන අයුරු පේළි 10 කින් විස්තර කරන්න

04. I. උත්පත්ති පොතට අනුව මුල්ම පාපයට ගොදුරු වූ දෙදෙනා නම් කර ඔවුන් කළ පාපය ලියන්න

II. මුල් මිනිසා ලැබූ පාපයේ ප්‍රතිඵල 03 ක් ලියන්න

III. දුර්පරීක්ෂාවක් පැමිණි විට ඔබ එය ජයගන්නා ආකාරයද,වැරදි මගට යොමු වූ මිතුරෙකුට යහ මඟ පෙන්වන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න

05. I. කායින් හා ආබෙල් දෙවිඳුන්ට පුද කළ දේ වෙන වෙනම ලියන්න

II. වරදට වැටුණු කායින්ට දෙවිඳුන් දුන් දඬුවම් හා එහි ප්‍රතිඵල 03 ක් ලියන්න.

III. සහෝදර ප්‍රේමයෙන් ජීවත් වීමට අප කළ යුතු දේ පේළි 10 කින් විස්තර කරන්න

06. I. "ගීතාවලිය ශුද්ධ බයිබලයේ යැදුම් පොතයි"වචන 150 කට නොඅඩු පුවත්පතකට ලිපියක් ලියන්න

07. පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

I. කායින් හා ආබෙල් ජීවිත තුළින් ඉගැන්වෙන පාඩම්

II. උත්. 3 -15 වගන්තිය ලියා ඉන් ලැබෙන පණිවිඩ

III. සුභාරංචි ග්‍රන්ථවල ඉගැනවීම්

IV පැරණි ගිවිසුමේ පොත් වර්ගීකරණය